(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **9.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 පෙබරවාරි 22 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** විදුලිබල අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **නසීර් අහමඩ් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු ලලිත් එල්ලාවල මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු උදයන කිරිදිගොඩ මහතා
ගරු ලලිත් වර්ණ කුමාර මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු මනෝ ගනේෂන් මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු එස්. බී. දිසානායක මහතා, කර්මාන්ත අමාත්‍යතුමා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු මයන්ත දිසානායක මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු සු. නෝගරාදලිංගම් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු උද්දික ප්‍රේමරත්න මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු නිපුණ රණවක මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
ගරු ජයරත්න හේරත් මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා
ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2022 පෙබරවාරි මස 21 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"I wish to inform Parliament that I have received the Determination of the Supreme Court in respect of the Bill titled **'Special Goods and Services Tax'** which was challenged in the Supreme Court in terms of Article 121(1) of the Constitution.

The Supreme Court makes the following Determination in terms of Article 120 read with 123 of the Constitution:—

(i) Clauses 2, 3 and 4 of the Bill are jointly and severally inconsistent with Article 148 read with Article 76(1) of the Constitution.

(ii) Clauses 2, 3 and 4 of the Bill are inconsistent with Article 3, read with Article 4(a) and 4(d) of the Constitution.

(iii) Clauses 2, 3 and 4 of the Bill are inconsistent with Article 12(1), read with Article 3 and 4(d) of the Constitution.

(iv) Clauses 2 and 3 of the Bill are inconsistent with Article 152 of the Constitution.

(v) Clause 9(1) of the Bill is inconsistent with Article 148 of the Constitution.

(vi) Clause 9(1) of the Bill is inconsistent with Article 149(1) and 150(1) of the Constitution.

(vii) Clauses 11(1) and 11(3) of the Bill are inconsistent with Article 4(c) read with Article 3 of the Constitution.

(viii) The Supreme Court has further stated that in view of the analysis contained in this Determination and the foregoing conclusions, and—

(a) in view of the inseparable nature of Clauses 2, 3, and 4 of the Bill;

(b) the compelling need to consider such Clauses of the Bill both individually and as a whole;

(c) as it is necessary to view Clauses 2, 3, and 4 of the Bill in conjunction with the remaining Clauses of the Bill; and

(d) the finding arrived at by the Supreme Court in Clauses 2, 3 and 4 of the Bill are irremediably inconsistent with Article 3 read with 4(a) and 4(d) of the Constitution and Articles 12(1), 76(1) and 148 of the Constitution,

acting in terms of Article 123(2)(c) of this Constitution, this Court holds that the **'Special Goods and Services Tax'** Bill requires to be passed as required by Article 84(2) of the Constitution, by not less than two-thirds of the whole number of Members of Parliament (including those not present) voting in favour thereof and approved by people at a Referendum by virtue of the provisions of Article 83 of the Constitution.

The Court has further stated that since it would be impracticable to suggest clause specific amendments to the Clauses of the Bill that have been found to be inconsistent with the Constitution as it would fundamentally alter the basic nature and structure of the Bill and become inconsistent with the declared objectives of the Bill, the Court while exercising discretion conferred on it by the Constitution will refrain from determining the manner in

which the afore-stated Clauses 2, 3, 4, 5 and 9(1) could be amended so as to alter such Clauses to become consistent with the Constitution.

I order that the Determination of the Supreme Court be printed in the Official Report of today's proceedings of the House."

**II**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2022 පෙබරවාරි 14 දින මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) නමැති පනත් කෙටුම්පතෙහි ද, 2022 පෙබරවාරි 17 දින අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන), පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම, අධිකරණ සංවිධාන (සංශෝධන), සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) නමැති පනත් කෙටුම්පත්වල ද මා විසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**III**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් හයක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

**IV**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා, වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127(3) හි විධිවිධාන ප්‍රකාරව 2022 පෙබරවාරි 17 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කිංස් නෙල්සන් මහතා එම කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**V**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කිංස් නෙල්සන් මහතා, පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127(3) හි විධිවිධාන ප්‍රකාරව 2022 පෙබරවාරි 17 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා එම කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**VI**

" 'ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත' සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළවන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා"

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) මහාමාර්ග අමාත්‍යවරයා 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය ඉදිරිපත් කර එම වාර්තාව, ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වර්තා පිළිගැන්වීම:** (1) වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික ගරු කනක හේරත් මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) (437 අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අගෝස්තු මස 18 දිනැති අංක 2241/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනතේ 9 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 2 වන වගන්තියේ (4) වන සහ (6) වන උපවගන්ති යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අප්‍රේල් මස 08 දිනැති අංක 2222/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iii) 2018 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2019 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(v) 2019 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(vi) 2019 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව;

(vii) 2017/2018 වර්ෂය සඳහා සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(viii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි සම්බන්ධයෙන් වූ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) පානදුර, වලාන, ගැමුණු මාවත, අංක 272/බී/01 දරන ස්ථානයෙහි පදිංචි ලියනගේ සුරංග පෙරේරා මහතාගෙන් සහ තවත් 13 දෙනෙකුගෙන් ලැබුණු 2021.11.23 දිනැති පෙත්සම; සහ

(ii) අගලවත්ත, සඳගිරිකන්ද, ඕමත්ත පාර යන ලිපිනයෙහි පදිංචි එස්. එච්. රත්නපාල මහතාගෙන් ලැබුණු 2020.09.14 දිනැති පෙත්සම

ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(2) වෙන්නප්පුව, හලාවත පාර, අංක 218 දරන ස්ථානයෙහි පදිංචි ඕ. ඒ. අනිල් නිශාන්ත දිනරත්න මහතාගෙන් ලැබුණු 2021.04.28 දිනැති පෙත්සම ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) පොකුණුවිට, වැලිගම්පිටිය, අංක 150/1 දරන ස්ථානයෙහි පදිංචි සමන්ත තුෂාර ගල්පායගේ මහතාගෙන් ලැබුණු 2021.07.15 දිනැති පෙත්සම ගරු දිලිප් වෙදආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

(4) පන්නිපිටිය, පැලන්වත්ත, කනත්ත පාර, අංක 217/1/4 දරන ස්ථානයෙහි පදිංචි එම්. ජී. සරත් මහතාගෙන් ලැබුණු 2021.07.09 දිනැති පෙත්සම ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් පිළිගන්වන ලදී.

(5) කන්තලේ, පරාක්‍රම මාවත, අංක 15 දරන ස්ථානයෙහි පදිංචි එම්. කේ. ඒ. මාලනී ගුණවර්ධන මහත්මියගෙන් ලැබුණු 2021.11.19 දිනැති පෙත්සම ගරු ලලිත් එල්ලාවල මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. අධිභාර බද්ද:** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— අධිභාර බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත, 2022 මාර්තු 08 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ නියෝග:** වැවිලි අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනතේ 9 වගන්තිය සමඟ කියවිය යුතු 2(4),(6) වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 අප්‍රේල් 08 දිනැති අංක 2222/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අ.භා. 12.05 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය" යි කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.27 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

"ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.21 ට ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.51 ට ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ නියෝග:** වැවිලි අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (437 අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 අගෝස්තු 18 දිනැති අංක 2241/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම (ඩෙංගු රෝගය පැතිරීම පාලනය):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; අ.භා. 5.19ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2022 පෙබරවාරි 23 බදාදා පූ.භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.